# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 8 ශ්‍රේණිය

## නාට්‍ය හා රංගකලාව    කාලය : පැය 2

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) නාට්‍යකට සුදුසු කතාවක සිදුවීමක තිබිය යුතු අනිවාර්ය ලක්ෂණයක් වන්නේ,
   i) ගැටුම් සහිතව කුතුහලයෙන් යුක්ත වීම.
   ii) කුතුහලයෙන් යුක්ත නොවීම.
   iii) මුල, මැද, අග මනාව නොගැලපීම
   iv) විශ්වාසනීයත්වයෙන් යුක්ත නොවීම.

(2) "අමර ගියා දිව්‍ය ලෝකෙ" නාට්‍යයේ අමර ජීවිතය අවබෝධ කරගන්නේ,
   i) අන් අයගේ මඟ පෙන්වීමෙනි
   ii) කම්මැලිව නිදා ගැනීමෙනි
   iii) යහළුවන් හා සෙල්ලම් කිරීමෙනි
   iv) ඔහු ලැබූ අත්දැකීමක් අනුවය.

(3) නාට්‍යකදී චරිතය ඉදිරිපත් කිරීමට නළුවාට පරිබාහිරව එක්කර ගන්නා සියලු දේ.
   i) ආංගික අභිනයට අයත් වේ.
   ii) ආහාර්ය අභිනයට අයත් වේ.
   iii) වාචික අභිනයට අයත් වේ.
   iv) සාත්වික අභිනයට අයත් වේ.

(4) නාට්‍ය නළුවරණය යනුවෙන් අදහස් කරන්නේ,
   i) නළු නිළියන් තෝරා ගැනීම.
   ii) චරිත පුහුණු කිරීම.
   iii) සංවාද කියවීම.
   iv) ඇඳුම් පැළඳුම් නිර්මාණය

(5) අද්භූත කතාවක් වන්නේ,
   i) හීල්බත් දංකුඩ කතාව
   ii) යසලාලක තිස්ස කතාව
   iii) බෝංචි වැලේ කතාව
   iv) අන්දරේ සීනි කෑ කතාව

(6) නාට්‍යක රූපණය යනුවෙන් අදහස් කරන්නේ,
   i) චරිතයක් නිරූපණය කිරීමයි
   ii) සංවාද භාවිතා කිරීමයි
   iii) පිටපත කියවීමයි
   iv) රංග අභයාස සිදුකිරීමයි

(7) හිස්, අත්, පාද, පපුව, උකුල ආදිය හඳුන්වන්නේ,
   i) අංග යනුවෙනි
   ii) ප්‍රත්‍යංග යනුවෙනි
   iii) උපාංග යනුවෙනි
   iv) කොටස් යනුවෙනි

(8) නාට්‍යක් රස විඳීමේදී ප්‍රධාන වේ.
   i) සටන් ජවනිකා
   ii) කතා වස්තුව
   iii) නළු නිළි රූපය
   iv) හාස්‍ය ජවනිකා

(9) මෙම නාට්‍ය අතර ළමා නාට්‍යක් නොවන්නේ,
   i) පුංචි අන්දරේ
   ii) තොප්පි වෙළෙන්දා
   iii) නරිබෑණා
   iv) පොල් ගෙඩියට ජරමරේ

(10) වේෂභූෂණ යනුවෙන් හඳුන්වන්නේ,
   i) චරිතය නිරූපණයයි.
   ii) මුහුණ සකස් කිරීමයි.
   iii) පසුතල නිර්මාණය කිරීමයි.
   iv) ඇඳුම් පැළඳුම් නිර්මාණයයි.

(11) නාට්‍ය පිටපතක අත්‍යවශ්‍ය අංගයක් නොවන්නේ,

i) සංවාද
ii) ආලෝකකරණය
iii) රංග විධාන
iv) චරිත

(12) වළහා මාෂා නාට්‍යයේ තේමාවක් නොවන්නේ,

i) හැම අයෙකු තුළම යහගුණ ඇති බව
ii) නරක අය යහපත් වන බව
iii) අවිහිංසාවාදී නොවීම
iv) නපුරු ළමයින් ප්‍රතික්ෂේප වීම

(13) සිරුරේ සියලු අඟ පසඟ සහිතව ශරීරය සම්පූර්ණයෙන් සැහැල්ලු වීම.

i) ශිථිලකරණ අභ්‍යාසයයි.
ii) දර්පණ අභ්‍යාසයයි.
iii) ස්වසන අභ්‍යාසයයි.
iv) තාපන අභ්‍යාසයයි.

(14) කටහඬ අභ්‍යාස ප්‍රගුණ කිරීම සඳහා,

i) නම්පොත හා බුදුගුණ අලංකාරය කියවිය යුතුය.
ii) බුද්ධ ගජ්ජය හා සකස්කඩ කියවිය යුතුය.
iii) සකස්කඩ හා ලෝවැඩ සඟරාව කියවිය යුතුය.
iv) ගුත්තිල කාව්‍ය හා නම්පොත කියවිය යුතුය.

(15) නාට්‍ය හා රංගකලාව විෂය හදාරණ ඔබ තුළ නොතිබිය යුත්තේ,

i) සාමූහික හැඟීම තිබිය යුතුය.
ii) සබකෝලය තිබිය යුතුය.
iii) එකිනෙකා අගය කිරීම සිදු කළ යුතුය.
iv) දරාගැනීමේ ශක්තිය තිබිය යුතුය.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

***(ශාන්ති කර්ම / නිසල රූ / භාව ප්‍රකාශනය / අධ්‍යක්ෂකවරයා / නළුවා / හීන / අනුශාංගික කලා)***

(16) සංවාද සහ චලන රහිත රංග ඉරියව් ........................................... නම් වේ.

(17) නාට්‍ය ගීතයක් ඉදිරිපත් කිරීමේදී කාලය, ශ්‍රැතිය පමණක් නොව ........................................... ද වැදගත් වේ.

(18) නාට්‍යයක් පුහුණුව හා සංවිධානය කිරීමේදී නායකත්වය දරණ පුද්ගලයා වන්නේ ........................................... ය.

(19) රංගාලෝකය, වේෂභූෂණ ආදිය ........................................... ලෙස හඳුන්වයි.

(20) උඩරට, පහතරට, සබරගමු වශයෙන් ........................................... වර්ගීකරණය වේ.

(ලකුණු $1 \times 20 = 20$)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන සංවාද කොටස ඇසුරින් පිළිතුරු සපයන්න.

A. අනේ වලස් රාළහාමි (අඬමින්) ...... මම ගෙදර යන්න ඕනා. මගේ ආච්චි මම එනකන් බයේ ඇති. අනේ.....

B. (ඇද කරයි)
ඈ....../...... හොහ් ..... හොහ් ......

A. මට ගෙදර යන්න ඕ...... නා..... (අඬයි)

B. හොඳයි. මම පාර කියන්නම්..... හැබැයි මං අහන ඒවට උත්තර දෙන්න ඕනා.

i) මෙහි A සහ B යන චරිත දෙක නම් කරන්න.

ii) මෙම කොටස උපුටාගත් නාට්‍ය නම් කරන්න.

iii) ඉහත කොටසෙහි ඇතුළත් රංග විධාන 2ක් ලියන්න.

iv) ආච්චි බයෙන් සිටින්නේ යැයි A චරිතය විසින් පැවසීමට හේතුව කුමක්ද?

v) ඔබ දන්නා ළමා නාට්‍ය 2ක් නම් කරන්න.

(ලකුණු $2 \times 5 = 10$)

02.

i) වේෂභූෂණ යන්න හඳුන්වන්න. (ල. 2)

ii) වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න. (ල. 4)

iii) රජ බිසව හෝ රජ චරිතයට සුදුසු වේෂභූෂණ ඇඳ දක්වන්න. (ල. 4)

03.

i) යාතුකර්ම ගී යනුවෙන් හඳුන්වන්නේ මොනවාද? (ල. 3)

ii) යාතුකර්ම ගී ගායනා තුළ දැකිය හැකි විශේෂතා 3 ක් ලියන්න. (ල. 3)

iii) ඔබ දන්නා යාතුකර්ම ගීයක් ලියන්න. (ල. 4)

04.

i) නළුවෙකුට තිබිය යුතු කුසලතා 2ක් ලියන්න. (ල. 2)

ii) නළුවෙකුට තිබිය යුතු ගුණාංග 2ක් ලියන්න. (ල. 2)

iii) රංග අභ්‍යාස තුළින් නළුවෙකුට ලද හැකි ප්‍රයෝජන 2ක් ලියන්න. (ල. 2)

iv) රංග ක්‍රීඩා 4ක් නම් කරන්න. (ල. 4)

05.

i) නාට්‍ය සඳහා යොදාගත් ජාතක කතා 4ක් නම් කරන්න. (ල. 2)

ii) එම එක් කතාවක් රචිත, රංග විධාන, ගැටුම, සංවාද සහිතව ඔබ කැමති පරිදි කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න. (ල. 8)